| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/09/CBO/ප්‍රතිපාදන/2021 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2021.09.06 |
|---|---|---|---|---|---|

සියළුම

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්

සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්

සමෘද්ධි බැංකු සමිති හා බැංකු කළමණාකරුවන්

සමෘද්ධි විධායක කමිටු හා පාලක මණ්ඩල සභාපතිවරුන්

සමෘද්ධි ප්‍රාදේශිය සංවිධාන හා ප්‍රජාමූල සංවිධාන සභාපතිවරුන්

**<u>සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශිය සංවිධාන සඳහා</u>**

**<u>කාර්යාල උපකරණ සපයාගැනිම වෙනුවෙන් ප්‍රතිපාදන ලබා දිම හා මුදල් ප්‍රේශණය කිරීම.</u>**

2021 සංශෝධිත ක්‍රියාකාරි සැලැස්මට අනුව 331-2-2-3-2509 භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ප්‍රජාමූල සංවිධාන අංශයට වෙන් වී ඇති මුදලින් සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශිය සංවිධාන සඳහා කාර්යාල උපකරණ සපයා ගැනීම වෙනුවෙන් දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල වෙත ලබා දෙන ප්‍රතිපාදන පදනම් කර ගනිමින් එම සංවිධානයන්හී නිල ඉතිරි කිරීමේ ගිණුමට බැර කිරිම පිණිස මුදල් ප්‍රේෂණය කරනු ඇත.

02. සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන සඳහා කාර්යාල උපකරණ සපයා ගැනීම වෙනුවෙන් රු. 5000/- ක මුදලක් සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ ඉතිරි කිරිමේ ගිණුමට බැර පිණිස අදාළ සමෘද්ධි බැංකුවේ ජංගම ගිණුම් හිමි වාණිජ බැංකුව වෙත දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල විසින් බැර නිවේදන මගින් මුදල් ප්‍රේෂණය කරනු ඇත. මෙය පියවර කිහිපයකින් සිදු කරනු ලබයි. පළමු පියවරේදී 2021.07.30 දිනට "අරුණළු සහන" ණය වැඩසටහන ආරම්භ කරන ලද ප්‍රජාමූල සංවිධාන වෙත රු. 5000/- බැගින් මුදල් ලබා දෙනු ඇත. මේ අයුරින් ඉදිරියේදී "අරුණළු සහන" ණය වැඩසටහන

ආරම්භ කිරීම පදනම් කර ගෙන එම ප්‍රජාමුල සංවිධාන වෙත රු. 5000/- බැගින් මුදල් ලබා දෙනු ඇත.

03. සමෘද්ධි ප්‍රාදේශිය සංවිධාන සදහා කාර්යාල උපකරණ සපයා ගැනිම වෙනුවෙන් රු. 25,000/- ක මුදලක් සමෘද්ධි ප්‍රාදේශිය සංවිධානයේ ඉතිරි කිරිමේ ගිණුමට බැර පිණිස අදාල සමෘද්ධි බැංකු සමිතියේ ජංගම ගිණුම හිමි වාණිජ බැංකුව වෙත දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල විසින් බැර නිවේදන මගින් මුදල් ප්‍රේෂණය කරනු ඇත. මෙයද පියවර කිහිපයකින් සිදු කරනු ලබයි. පළමු පියවරේදී "ප්‍රාදේශිය විගණන ඒකක" ලෙස නම් කර ඇති ස්ථාන අයත් වන සමෘද්ධි බැංකු සමිති වෙත රු. 25,000/- බැගින් මුදල් ලබා දෙනු ඇත.

04. සමෘද්ධි ප්‍රජාමුල සංවිධාන හා ප්‍රාදේශිය සංවිධාන සදහා කාර්යාල උපකරන සපයා ගැනිම වෙනුවෙන් සමෘද්ධි බැංකු හා බැංකු සමිති වෙත ප්‍රේෂණය කරනු ලබන මුදල්, එම සංවිධාන වලට අයත් ඉතිරි කිරිමේ ගිණුමට බැර කල යුතු අතර ඒ බව එම සංවිධාන වල සභාපතිවරුන් වෙත නිවේදන ලිපියකින් දැනුම් දිය යුතු වේ.

05. 2021.08.18 දිනැතිව නිකුත් කරන ලද සමෘද්ධි චක්‍රලේඛ අංක 09/2021/ප්‍රජාමුල/14/2021/01 ට අනුව සමෘද්ධි ප්‍රජාමුල සංවිධාන හා ප්‍රාදේශිය සංවිධාන විසින් කඩිනමින් "කාර්යාල" පිහිටුවා සේවා සැපයිම ආරම්භ කල යුතු වේ. එසේ පිහිටුවනු ලබන කාර්යාල සදහා කාර්යාල උපකරන සපයා ගැනිම වෙනුවෙන් ප්‍රේෂණය කරනු ලබන මුදල් ප්‍රජාමුල සංවිධාන හා ප්‍රාදේශිය සංවිධාන සදහා මුදලින් නිදහස් කල යුතු වේ. සමෘද්ධි ප්‍රජාමුල සංවිධාන හා ප්‍රාදේශිය සංවිධානයන්හි විධායක සභාව තිරණය කරන පරිදි කාර්යාල උපකරණ සපයා ගත යුතු අතර ඒ සදහා විධායක සභාවේ තිරණය මත සංවිධාන සතු මුදල්ද භාවිතා කළ හැකි වේ.

06. සමෘද්ධි ප්‍රජාමුල සංවිධාන හා ප්‍රාදේශිය සංවිධාන සදහා කාර්යාල උපකරණ සපයා ගැනීම වෙනුවෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබෙන මුදල් හා එම සංවිධාන සතු මුදල් ද පදනම් කර ගෙන අදාල සංවිධානයේ විධායක සභාව විසින් තීරණය කරන පරිදි අවශ්‍ය කාර්යාල උපකරණ ප්‍රජාමුල සංවිධානයේ සාමාජිකත්වය දරණ වඩු කාර්මිකයින්ගෙන් හෝ ග්‍රාමීය නිෂ්පාදකයින්ගේ සහාය ලබා ගෙන දේශිය නිෂ්පාදනයන්ට ප්‍රමුඛත්වය ලබා දෙමින් සපයා ගත යුතු වේ.

07. මෙම ලිපියේ සදහන් උපදෙස් පරිදි කාර්යාල උපකරන අදාල සංවිධාන විසින් සපයා ගත් බවට ලිඛිත තහවුරුවක් ප්‍රජාමුල සංවිධාන භාරව සිටින උපාධිධාරී සංවර්ධන නිලධාරින් හෝ කලාප සහකාර කළමණාකරුවන් මගින් ලබා ගෙන එය ප්‍රාදේශිය විගණණ ඒකක භාර බැංකු සමිති කළමණාකරුගේ නිර්දේශයෙන් දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ / නියෝජ්‍ය සහ සහකාර අධ්‍යක්ෂ මගින් ප්‍රජාමුල සංවිධාන භාර අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතු වේ.

මේ කාර්ය සාර්ථකව ඉටු කර ගැනිම වෙනුවෙන් හා සමෘද්ධි ප්‍රතිලාභින්ට කාර්යක්ෂම සේවයක් ලබා දීම වෙනුවෙන් ඔබ සැම දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

අත්සන් කලේ

පී.ආර්.ඩී.එච්.අනුරවංශ
අධ්‍යක්ෂ (ප්‍රජාමුල සංවිධාන) - රා.ආ.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

1. ලේකම් - මුදල් අමාත්‍යාංශය
2. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මුල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
3. විගණකාධිපති

කා.දැ.ස

4. දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්
5. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
6. ප්‍රාදේශිය ලේකම්වරුන්

අ.ක.ස

7. ප්‍රධාන ගණකාධිකාරි - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
8. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
9. සියළුම අංශ ප්‍රධානින් - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව